# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2366/44 – 2024 ජනවාරි මස 13 වැනි සෙනසුරාදා – 2024.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2020/257.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.03.22 දිනැති හා අංක 2324/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.03.08 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පුහුල්වැල්ල, කිරින්ද, අංක 107 හි පදිංචි උදේනි රූපිකා සෙල්ලහේවා මිය සහ කොළඹ 05, නාරාහේන්පිට, ඇල්විටිගල මාවත, " නිපුණතා පියස", 4 වන මහල, අංක 354/2 හි පිහිටි ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A31/2023 හා 2023.11.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 දෙසැම්බර් මස 21 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම් කිරීමේ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

1R /COM/01/2020/257.
නඩු අංකය: ඒ/31/ 2023.

උදේණි රූපිකා සෙල්ලහේවා මිය,
නො. 107,
කිරින්ද,
පුහුල්වැල්ල.

*පළමු පාර්ශ්වය*

සහ

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
354/2,
4 වන මහල,
**“**නිපුණතා පියස”,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

*දෙවැනි පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල.

**පෙනී සිටීම:**

පළමු වන පාර්ශ්වය වෙනුවෙන් - ඉල්ලුම්කාරිනිය සහ නීතිඥ සරත් මහීපුත්‍ර පතිරත්න

දෙවන පාර්ශ්වය වෙනුවෙන් -

1. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය වෙනුවෙන් මානව සම්පත් සහ පරිපාලන සහකාර අධ්‍යක්ෂිකා ශ්‍යාමලී ගමඇතිගේ මහත්මිය
2. නීති නිලධාරිණි අලෝකා ද සිල්වා මහත්මිය
3. නීතිඥ සෙත් ගනේපොළ මහතා

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් වන ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ආරාවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ.

“ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සේවය කරන උදේනී රූපිකා සෙල්ලහේවා මහත්මියට තනතුරේ I ශ්‍රේණිය 2008.02.26 සිට ලබා දීම මඟින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද කවරදා සිට ද යන්නත් පිළිබඳ වේ”

මෙම නඩුව ප්‍රථම වරට 2023.04.04 වන දින කැඳ වූ අතර එහි දී පළමු පාර්ශ්වය විසින් ප්‍රස්තුත කරුණ සම්බන්ධයෙන් පිටපත් තුනකින් යුතුව සිය පළමු ප්‍රකාශය ගොනු කරන ලදි. ඒ අනුව එම ප්‍රකාශයේ පිටපතක් එදිනම දෙවන පාර්ශ්වයට ලබා දෙන ලදි. එහි දී දෙවන පාර්ශ්වය විසින් සිය පළමු ප්‍රකාශය ගොනු කිරීමට කල් ඉල්ලා සිටි අතර ඒ අනුව එම ප්‍රකාශය 2023.04.19 දින හෝ ඊට ප්‍රථම පිටපත් තුනකින් යුතුව බේරුම්කරණ අංශයට ගොනු කරන ලෙසත් බේරුම්කරණ අංශය විසින් එහි පිටපතක් පළමු පාර්ශ්වයට තැපැල් මඟින් යැවීමටත් නියෝග කරන ලදි.

මෙම නඩුව 2023.05.15 දින නැවත කැඳවූ අතර පාර්ශ්වයන් දෙක විසින් තම පළමු ප්‍රකාශයන් ගොනුකර තිබුණි. එහිදී බේරුම්කරු විසින් මීළඟ නඩු දිනයේදී දෙවන පාර්ශ්වය විසින් පහත කරුණු පිළිබඳව තොරතුරු අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට නියෝග කරන ලදි.

01. 2006.12.28 වන දින පැමිණිලිකාරිය වන උදේනී රූපිකා සෙල්ලහේවා මියට තම පළමු වන ශ්‍රේණි උසස්වීම් ලබා නොදීමට හේතු වූ කරුණු,

02. 2006.12.28 වන දින ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ කී දෙනෙකුට එම උසස්වීම ලබා නොදුන්නා ද,

03. 2008.02.25 වන දින පැමිණිලිකාරිය හැර තවත් යම් අයෙකුට වෘත්තීය පුහුණු අධිකාරිය විසින් උසස්වීම් ලබා දුන්නේද?

04. 2006.12.28 වන දින සිට තවත් අයට උසස්වීම් ලබාදී ඇත්නම් පැමිණිලිකාරියට එදින සිට උසස්වීම් නොදී සිටීමට හේතු කවරේද?

05. කම්කරු දෙපාර්තමේන්තුව විසින් අවස්ථා දෙකක දී නිර්දේශ ලබා දී තිබියදී එය ලබා නොදීමට හේතු කවරේද?

මෙම නඩුව නැවතත් 2023.06.12 වන දින කැඳවූ අතර පෙර නඩු දිනයේදී අධිකරණය විසින් විමසූ ප්‍රශ්න වලට එදින වාචික පිළිතුරු සපයමින් දෙවන පාර්ශ්වය කියා සිටියේ පළමු පාර්ශ්වයට 2006.12.28 වන දින පළමු වන ශ්‍රේණියේ උසස් වීම ලබා නොදීමට හේතු වූයේ පැමිණිලිකාරිය කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූයේ 2008 දී බැවිනුත් 2006 කිසිදු විභාගයකට ඇය ඉදිරිපත් නොවී තිබූ නිසා බැවිනුත්ය. එමෙන්ම කම්කරු දෙපාර්තමේන්තුව විසින් මීට පෙර පැමිණිලකාරිය සම්බන්ධයෙන් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක නොකිරීමට හේතු, දෙවන පාර්ශ්වය විසින් නියමිත කාලය තුළ කම්කරු දෙපාර්තමේන්තුවේ අදාළ අංශ වෙත දැනුම් දී ඇති බව ද එහිදී ප්‍රකාශ කෙරිණි. මෙහිදී පළමු පාර්ශ්වය කියා සිටියේ 2008 වර්ෂයේ පැවති ඉගැන්වීමේ ක්‍රමවේදය පිළිබඳ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව සමත් වූ ඩී. පී. යාලගම මහතා සහ ඩී. එම්. බී. එස්. නිසංසනී මිය 2006.12.28 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි උපදේශක පළමු වන ශ්‍රේණියට උසස් කර පත්වීම් ලිපි නිකුත් කිරීම මගින් පැමිණිකාරියට අසාධාරණයක් සිදු වී ඇති බවයි. අධිකරණය විසින් දෙපාර්ශ්වයටම දන්වා සිටියේ එදින වාචිකව ඉදිරිපත් කළ කරුණු සහ එම කරුණු මත පැනනගින වෙනත් කාරණා ලිඛිත ප්‍රකාශයක් මගින් පිටපත් තුනකින් 2023.06.30 වන දිනට පෙර බේරුම්කරණ අධිකරණයට ඉදිරිපත් කරන ලෙසත්, එම ප්‍රකාශ සලකා බැලීමෙන් අනතුරුව මෙම නඩුව විභාග කිරීම සම්බන්ධයෙන් තීරණයක් ලබා දෙන බවත්ය. මෙහිදී දෙවන පාර්ශ්වය විසින් බේරුම්කරණ අධිකරණයෙන් අයැද සිටියේ දෙපාර්ශ්වයෙන්ම ලිඛිත ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව හරස් ප්‍රශ්න ඇසීමට දෙපාර්ශ්වයටම අවස්ථාව ලබා දෙන ලෙසය.

මෙහි දී පළමු වන පාර්ශ්වය අයැද සිටියේ කාර්මික ආරාවුල් පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව බේරුම්කරුගේ අභිමතය පරිදි සාක්ෂි විභාගයකින් තොරව අවශ්‍ය ලිඛිත සාක්ෂි ලබා ගෙන යුක්ති සහගත සහ සාධාරණ තීන්දුවක් අධිකරණයට ලබා දිය හැකි බවත් එබැවින් දෙවන පාර්ශ්වය අයැද සිටි විරෝධතාවය ප්‍රතික්ෂේප කොට ලිඛිත දේශන ලබා දීමෙන් පසු තීන්දුවක් දෙන ලෙසත් ය.

මීළඟ නඩු දිනය වූ 2023.07.13 වන දින දෙවන පාර්ශ්වය විසින් සිය ලිඛිත දේශන පිටපත් තුනකින් යුක්තව අධිකරණයට ගොනු කරන ලද අතර එදිනම එහි පිටපතක් පළමු පාර්ශ්වය වෙත ලබා දෙන ලදි. පළමු පාර්ශ්වය විසින් 2023.06.30 වන දින සිය ලිඛිත දේශන පිටපත් තුනකන් බේරුම්කරණ අධිකරණයට ඉදිරිපත් කර තිබුණි. මෙහිදී මෙම ලිඛිත දේශන අධ්‍යනයට කල් අවශ්‍ය බැවින් මෙම නඩුව 2023.07.26 දින තෙක් කල් තබිණි.

2023.07.26 වන දින මෙම නඩුව කැඳ වූ අවස්ථාවේදී පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා දන්වා සිටියේ පළමු පාර්ශ්වය විසින් පළමු ප්‍රකාශයත්, ලිඛිත දේශනයත් දැනටමත් ගොනු කර ඇති බැවින් සාක්ෂි මෙහෙයවීමට බලාපොරොත්තු නොවන බවය. තව ද එම ප්‍රකාශවල කරුණු හා ලේඛන මත දෙවන පාර්ශ්වයට හරස් ප්‍රශ්න ඇසීමට හැකි බව ද පැමිණිලිකාරිනියගේ නීතිඥ විසින් තවදුරටත් දන්වා සිටින ලදි. මෙහිදී දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ ඉල්ලා සිටියේ මෙම හරස් ප්‍රශ්න ඇසීමට අධිකරණයෙන් ඉදිරි දිනයක් දෙන ලෙසය.

ඒ අනුව මෙම නඩුව 2023.08.24 දින කැඳවූ අතර එහිදී පළමු පාර්ශ්වය වන උදේනී රූපිකා සෙල්ලහේවා මහත්මිය ප්‍රතිඥා දීමෙන් අනතුරුව දෙවන පාර්ශ්වයේ නීතිඥ විසින් හරස් ප්‍රශ්න අසන ලදි. (2023.08.24 අධිකරණ සටහන් හා සබැඳේ) හරස් ප්‍රශ්න ඇසීමෙන් අනතුරුව අධිකරණ විසින් දෙවන පාර්ශ්වයට දන්වා සිටියේ මීළඟ නඩු දිනයේ දී ඩී. පී. යාලගම මහතා සහ ඩී. එම්. බී. එස්. නිසංසනී මහත්මියට 1 ශ්‍රේණියට උසස්වීම් ලබාදුන් ලිපිවල සහතික කළ පිටපත් සහ එදින පැමිණිලිකාරිය විසින් අධිකරණයට ඉදිරිපත් කළ ප්‍රතිඵල ලේඛනය කුමක් ද යන්නත් පැහැදිලි විස්තරයක් ලබාදෙන ලෙසය.

මෙම නඩුව නැවතත් 2023.09.07 වන දින කැඳවන ලදි. මෙහිදී පැමිණිලිකාර පාර්ශ්වය විසින් පෙර නඩු දින ඉදිරිපත් කළ ප්‍රතිඵල ලේඛන ( ඒ - 2, ආර් - 6) දෙවන පාර්ශ්වයේ ආයතනය, උසස්වීම් ලබා දීම සඳහා 2008 දී පැවැත් වූ ඉගැන්වීමේ ක්‍රමවේදය ගැන පරීක්ෂණයට අදාළ ප්‍රතිඵල ලේඛනයක් බව එම පාර්ශ්වය විසින් පිළිගන්නා ලදි. මින් අනතුරුව ප්‍රතිඥා දීමෙන් පසු පැමිණිලිකාරියගෙන්, දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටින නීතිඥ හරස් ප්‍රශ්න ඇසීම ආරම්භ කරන ලදි. ඒ අතරතුර පෙර නඩු දිනයේදී අධිකරණයෙන් ඉල්ලා සිටි පරිදි ඩී. පී. යලගම මහතා සහ ඩී. එම්. බී. එස්. නිසංසනී මහත්මියගේ 1 ශ්‍රේණියට උසස් කිරීමේ ලිපි පිටපත් ආර්. 12 සහ

ආර්. 13 ලෙස අධිකරණයට ඉදිරිපත් කරන ලදි. එදින දෙවන පාර්ශ්වය විසින් පැමිණිලිකාරියගෙන් හරස් ප්‍රශ්න ඇසීම අවසන් කරන ලදි. (2023.09.07 දින අධිකරණ සටහන් හා සබැඳේ)

මෙම නඩුව නැවතත් 2023.09.22 වන දින කැඳවූ අතර දෙවන පාර්ශ්වය වෙනුවෙන් සහකාර අධ්‍යක්ෂිකා මානව සම්පත් හා පරිපාලන ශ්‍යාමලී ගමඇතිගේ මහත්මිය ප්‍රතිඥා දීමෙන් අනතුරුව මූලික සාක්ෂි දීමට කැඳවන ලදි. (2023.09.22 දින අධිකරණ සටහන් හා සබැඳේ).

මීළඟට 2023.10.04 වන දින මෙම නඩුව නැවතත් කැඳවූ අතර එහිදී දෙවන පාර්ශ්වය නියෝජනය කරමින් මානව සම්පත් හා පරිපාලන සහකාර අධ්‍යක්ෂිකා ශ්‍යාමලී ගමඇතිගේ මහත්මිය ප්‍රතිඥා දීමෙන් අනතුරුව වැඩිදුරටත් මූලික සාක්ෂි ඉදිරිපත් කරන ලදි. එදින එම මහත්මිය විසින් මූලික සාක්ෂි ලබාදීම අවසන් කළ අතර මීළඟ නඩු දිනයේදී ඇයගෙන් හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාව ලබාදෙනබව අධිකරණය දැනුම් දුනි. (2023.10.04 වන දින අධිකරණ සටහන් හා බැඳේ)

නැවත 2023.10.26 දින මෙම නඩුව කැඳවූ අතර දෙවන පාර්ශ්වය නියෝජනය කරමින් පැමිණි මීට පෙර සාක්ෂි ලබාදුන් මානව සම්පත් හා පරිපාලන සහකාර අධ්‍යක්ෂිකා ශ්‍යාමලී ගමඇතිගේ මහත්මියගෙන් පළමු පාර්ශ්වයේ නීතිඥ හරස් ප්‍රශ්න අසා අවසන් කරන ලදි. ඉන් පසු තවදුරටත් බේරුම්කරු සහ දෙවන පාර්ශ්වයේ නීතිඥ ඇයගෙන් වැඩිදුරටත් කරුණු විමසීමෙන් පසු බේරුම්කරණ අධිකරණය දෙපාර්ශ්වයටම දන්වා සිටියේ සිය අවසන් ලිඛිත දේශන 2023.11.10 වන දිනට හෝ ඊට පෙර බේරුම්කරණ අංශයට භාර දෙන ලෙසය. (2023.10.26 වන දින අධිකරණ සටහන් හා සබැඳේ)

මෙම නඩුවේ දෙපාර්ශ්වයෙන්ම ඉදිරිපත් කළ පළමු ප්‍රකාශයන්, ලිඛිත දේශන සහ නඩුව විභාග කිරීමෙන් අනතුරුව පෙනී යන්නේ ඉල්ලුම්කාරිය වන උදේනි රූපිකා සෙල්ලහේවා මහත්මියට 2008.02.26 දින සිට I ශ්‍රේණිය ලබා දීම මඟින් කිසිදු අසාධාරණයක් සිදුව තිබේ ද යන්න ඔප්පු කිරීම සඳහා කිසිදු සාක්ෂියක් හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීමට පළමු පාර්ශ්වය අපොහොසත් වී ඇති බැවින් ඇයට සහන නිර්දේශ කිරීමට හැකියාවක් නොමැති බවය.

**නියෝගය:**

බේරුම්කරණ නඩුවට අදාළව ඉදිරිපත් කළ සියළු සාක්ෂි සහ ලිඛිත ප්‍රකාශයන් අනුව ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මෙම නඩුවේ පළමු පාර්ශ්වය වන උදේනි රූපිකා සෙල්ලහේවා මහත්මියට 2008.02.26 වන දිනට පසුදාතම කර ලබා දී ඇති 1 ශ්‍රේණියට උසස් වීම 2006.12.28 වන දින දක්වා නැවතත් පසුදාතම කිරීමට අවශ්‍ය සාක්ෂි හෝ ලේඛන පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමත් 2003 වසරේ පැවති I, II ශ්‍රේණි වලට උසස් කිරීමේ විභාග දෙකම අසමත් වූ බව අධිකරණය ඉදිරියේදී ඉල්ලම්කාරිය විසින්ම පිළිගත් හෙයිනුත් 2003 සහ 2008 වර්ෂයන් අතර පැවති කිසිදු ශ්‍රේණි උසස් කිරීමේ විභාගයන් වලට ඇය පෙනී නොසිටි නිසාත් ඉල්ලම්කාරිය විසින් බේරුම්කරණ අධිකරණයට ඉදිරිපත් කර ඇති ඉල්ලීම නිෂ්ප්‍රභ කරන බව දන්වමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත නියෝගයක් බව සහතික කරමි.

2023 නොවැම්බර් මස 30 වන දින දීය.

රමාල් අයි සිරිවර්ධන,
බේරුම්කරු.

EOG 01 - 0113